# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක - 2199/12 - 2020 ඔක්තෝබර් මස 28 වැනි බදාදා - 2020.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

එල්.ඩී.බී. 21/78 (XV) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය පිහිටුවනු ලැබූ, එකී පනතේ 24අ වගන්තිය සමග කියවිය යුතු 24ආ වගන්තිය යටතේ සාදනු ලැබූ නියමය අන්තර්ගත 1995 පෙබරවාරි මස 23 වැනි දින අංක 859/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට බලාත්මකවන පරිදි මෙයින් අහෝසි කරනු ලැබේ.

මහාචාර්ය ජී. එල්. පීරිස්,
අධ්‍යාපන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

---

එල්.ඩී.බී. 21/78 (XV) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ජී. එල්. පීරිස් වන මා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන්-

*(අ)* දේශීය වෛද්‍ය විද්‍යාව, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය සහ දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන ශාඛාවන් හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා, 2021 මාර්තු මස 1 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි, විශ්වවිද්‍යාලයක්, පිහිටුවමි. විශ්වවිද්‍යාලය අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වන්නේ ය;

1A - PG 5205 — 521 (2020/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*(ආ)* "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව" යන නාමය සහ අභිධානය එකී විශ්වවිද්‍යාලයට දෙමි;

*(ඇ)* එම විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පිහිටුවනු ලැබිය යුතු ස්ථානය ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත විය යුතු බවට සඳහන් කරමි ;

*(ඈ)* තෝරාගත් විෂයයන් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ලබාගැනීමේ හැකියාව ඇතිව ශිෂ්‍යයන්ට ඉතා හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ ඇතිව විෂයයන් රාශියකට අදාළ පාඨමාලා කිහිපයක් විශ්වවිද්‍යාලය විසින් ඇති කළ යුතු බව නියම කරමි ;

*(ඉ)* දේශීය සම්පත් පදනම තුළ වටිනාකම් නිර්මාණය කිරීම සඳහා ශිෂ්‍යයන් දැනුවත් කිරීම පිණිස විශ්වවිද්‍යාලය වැඩි අවධානයක් යොමු කළ යුතු බව නියම කරමි ; සහ

*(ඊ)* මෙහි උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයේ දක්වා ඇති පීඨ සහ අධ්‍යයන අංශවලින් විශ්වවිද්‍යාලය සමන්විත විය යුතු බව නියම කරමි.

**උපලේඛනය**

| | *I වන තීරය*<br>*පීඨ* | *II වන තීරය*<br>*අධ්‍යයන අංශ* |
|---|---|---|
| 1. | දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය<br>චිකිත්සා අධ්‍යයන අංශය<br>ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය<br>කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය<br>ශල්‍යශාලක්‍ය අධ්‍යයන අංශය<br>භාෂා අධ්‍යයන අංශය<br>රෝග විඥාන අධ්‍යයන අංශය<br>දේශීය චිකිත්සා අධ්‍යයන අංශය |
| 2. | දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය<br>තාක්ෂණ අධ්‍යයන අංශය<br>දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය |
| 3. | දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය<br>කළමනාකරණ අධ්‍යයන අංශය |
| 4. | පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | |

මහාචාර්ය **ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 27 වැනි දින
කොළඹ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.